බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
**External Degrees and Extension Courses Unit**
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
**University of Sri Jayewardenepura**


මගේ අංකය / My Number } USJP/EEX/11/2025
ඔබේ අංකය / Your Number }
දුරකථනය / Telephone } 011-2801481,011-3132496
ෆැක්ස් / Fax } 011-2802753

ලිපිනය / Address } තැපැල් පෙට්ටිය 10, ගංගොඩවිල, Post Box 10,Gangodawila, නුගේගොඩ, ශ්‍රී ලංකා, Nugegoda, Sri Lanka,
වෙබ් අඩවිය / Website } www.external.sjp.ac.lk
විද්‍යුත් තැපැල / E-mail } info.ext@sjp.ac.lk


2025-03-24

ප්‍රිය ශිෂ්‍ය/ශිෂ්‍යාවනි,

# 2017/2018/2019/2020/2021 සහ 2022 පුනර් සිසුන් සඳහා අයදුම්පත් කැඳවීම

## සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි II පුනර් පරීක්ෂණය - 2025

**01. පුනර් පරීක්ෂණය සඳහා අයදුම් කිරීමට හා පුනර් පරීක්ෂණ ගාස්තු ගෙවීම සඳහා පහත උපදෙස් අනුගමනය කරන ලෙස කරුණාවෙන් දන්වමි.**

| | |
|---|---|
| පුනර් පරීක්ෂණ අයදුම්පත සහ පුනර් පරීක්ෂණ ගාස්තු ගෙවිය යුතු ගිණුම් අංකය | www.external.sjp.ac.lk වෙබ් අඩවියේ Bachelor of Social Sciences (General) External Degree in Environmental & Development Studies/Exam Applications වෙත පිවිස ඉහත පරීක්ෂණය යටතේ ඇති වෙබ් පිටුවේ ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය "v"අකුර රහිතව යෙදීමෙන් බාගත (Download) කර ගත හැක. |
| පුනර් පරීක්ෂණ ගාස්තු<br>එක් විෂයයක් සඳහා<br>විෂයයන් 2 ක් සඳහා<br>විෂයයන් 3 ක් සඳහා<br>විෂයයන් 4 ක් සඳහා හෝ වැඩි සංඛ්‍යාවක් සඳහා | <br>රු. 5000/=<br>රු. 7000/=<br>රු. 9000/=<br>රු. 11000/= |
| අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, තැපැල් පෙට්ටිය අංක 10, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ යන ලිපිනයට **ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.** |
| අයදුම්පත් යොමු කළ යුතු විද්‍යුත් ලිපිනය | **අයදුම්පත් තැපැල් කිරීමට පෙර exams.edecu@sjp.ac.lk විද්‍යුත් ලිපිනයට ස්කෑන් කර එවිය යුතු අතර ස්කෑන් පිටපත (Scan Copy) සහ අප වෙත එවන දෘඩ පිටපත (Hard Copy) එකම විය යුතුය. වෙනස්කම් සහිත පිටපත් භාරගනු නොලැබේ.** |
| විභාග අයදුම්පත් සහ ලියාපදිංචිය දීර්ඝ කිරීමේ අයදුම්පත් භාරගන්නා අවසාන දිනය | **2025 අප්‍රේල් 04 දින දක්වා දීර්ඝ කර ඇත.** |
| **පහත පරිදි ලියාපදිංචිය දීර්ඝ කිරීම අනිවාර්ය වේ**<br><br>2017 වර්ෂයේ ලියාපදිංචි සිසුන්<br>2024-08-14 දින දක්වා<br>2018 වර්ෂයේ ලියාපදිංචි සිසුන්<br>2024-08-31 දින දක්වා<br>2019 වර්ෂයේ ලියාපදිංචි සිසුන්<br>2024-06-30 දින දක්වා<br>2020 වර්ෂයේ ලියාපදිංචි සිසුන්<br>2024-08-31 දින දක්වා | ලියාපදිංචිය දීර්ඝ කිරීම පිළිබඳ විස්තර **www.external.sjp.ac.lk** වෙබ් අඩවියේ **Registration renewal** වෙබ් පිටුවට පිවිස ලබාගත හැක.<br><br>**2017 අධ්‍යයන වර්ෂයේ ලියාපදිංචි සිසුන්ට උපාධි 2 පුනර් පරීක්ෂණය සඳහා පෙනී සිටිය හැකි අවසන් අවස්ථාව වේ.** |

02 . සැලකිය යුතුයි

I. **<u>පුනර් පරීක්ෂණ අයදුම්පත් යොමු කිරීමට පෙර පාඨමාලා ගාස්තු වාරික සියල්ලම ගෙවා සම්පූර්ණ කර තිබිය යුතුයි.</u>**

II. නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් පරීක්ෂණ ගාස්තු ගෙවීමෙන් අනතුරුව, අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට ප්‍රථම, ඉහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ ඉහළ වම් කෙළවරේ පරීක්ෂණයේ නම සඳහන් කළ යුතු වේ.

III. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2025 අප්‍රේල් 04 වන අතර එම දිනයෙන් පසුව කිසිදු හේතුවක් මත අයදුම්පත් භාර ගනු නොලැබේ.

IV. පුනර් පරීක්ෂණ ගාස්තු ගෙවීම සඳහා එක් අයදුම්කරුවකු වෙනුවෙන් සුවිශේෂී ගිණුම් අංකයක් බැගින් ඇති අතර අදාළ ගිණුම් අංකයට පමණක් ගෙවීම් කළ යුතුය. **(එහි ඡායාපිටපතක් ළග තබාගත යුතු අතර වෙනත් ගිණුම් අංකවලට ගෙවන ලද මුදල් පිළිබඳ විශ්වවිද්‍යාලය වග කියනු නොලැබේ)**

V. **<u>නියමිත පරිදි මුදල් නොගෙවන ලද, ලියාපදිංචිය දීර්ඝ නොකරන ලද අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.</u>**

VI. සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි II පුනර් පරීක්ෂණ කාල සටහන www.external.sjp.ac.lk යන බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ වෙබ් අඩවියේ පලකරන අතර සියළු දැනුවත් කිරීම් වෙබ් අඩවිය හරහා පමණක් සිදුකරන බැවින් **නිරතුරුවම වෙබ් අඩවිය පරිශීලනය අත්‍යවශ්‍ය වේ.**

VII. විදෙස්ගත සිසුන් සඳහා විභාග අයදුම්පත් ඉදිරිපත් කර මාර්ගගත ක්‍රමය ඔස්සේ පරීක්ෂණ (EDECU Online Distance Supervision Examinations) සඳහා පෙනී සිටිය හැකි වේ. ඒ සම්බන්ධයෙන් විස්තර http://external.sjp.ac.lk/online-exminations-for-migrated-students/ වෙත පිවිසීමෙන් ලබාගත හැකි වේ.

VIII. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය 428 වන සනාතන සභාවෙන් අනුමත කරන ලද සංශෝධිත නව විභාග නීති රීති මාලාව Bachelor of Social Sciences (General) External Degree in Environmental & Development Studies/Exam Rules & Regulations වෙත පිවිස පරිශීලනය කළ හැක.

IX. උපාධියක් සම්පූර්ණ කිරීම සඳහා සපුරාගත යුතු අවශ්‍යතාවන් පිළිබඳ විස්තර www.external.sjp.ac.lk වෙබ් අඩවියේ පල කර ඇති ශිෂ්‍ය විවරණිකාව (Prospectus) පරිශීලනය කිරීමෙන් ඔබට ලබාගත හැක.

X. නියමිත පරිදි වෛද්‍ය වාර්තා ඉදිරිපත් කර ප්‍රතිඵල නිකුත් කිරීමේදී වෛද්‍ය වාර්තා අනුමත වුවද (ප්‍රතිඵල ලේඛනයේ MC ලැබුණු ද) මෙම පරීක්ෂණය සඳහා අදාල විභාග ගාස්තු ගෙවීම අනිවාර්ය වේ.

XI. නියමිත දිනට මෙම පරීක්ෂණය සඳහා සම්පූර්ණ කළ අයදුම්පත් ඉදිරිපත් කළ සිසුන්ගේ විභාග ප්‍රවේශපත්‍ර www.external.sjp.ac.lk වෙබ් අඩවියේ Bachelor of Social Sciences (General) External Degree in Environmental & Development Studies/Exam Admissions වෙත පිවිස ලබාගත හැකි අතර **<u>විභාග ප්‍රවේශපත් තැපැල් මගින් නිකුත් නොකෙරේ.</u>**

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය